පේදුරුතුඩුව ප්‍රාදේශිය සභාව
යාපනය දිස්ත්‍රික්කය
-----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරිම.

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 31 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 අප්‍රේල් 01 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2014 නොවැම්බර් 26 දින සභාවේ සභාපති වෙත ඉදිරිපත් කරන ලදි.

1.2 මතය

මෙම වාර්තාවේ දැ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශ වලින් 2013 දෙසැම්බර් 31 දිනට පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 ගිණුම් ප්‍රකාශ පිළිබඳවා අදහස් දැක්විම.

1.3.1 ගිණුම්කරණ ඌණතා.

(i.) ගිණුම් ප්‍රකාශවල නිරික්ෂණය වූ ඌනතා වත්කම්, ආදායම් සහ බැරකම් වශයෙන් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම | වත්කම් | | ආදායම් | | බැරකම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | රු. | | රු. | | රු. |
| වැඩියෙන් දැක්විම් | 01 | 54,950 | | | | |
| අඩුවෙන් දැක්විම් | | | 01 | 1,147,750 | 02 | 239,628 |
| අත්හැරීම් | 01 | 26,550 | | | | |

පරිත්‍යාග වශයෙන් ලද වාහන 13 ක වටිනාකම තක්සේරු කර ගිණුම් වලට ගෙන නොතිබූ බැවින් වාහන වල වටිනාකම ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳූ ගිණුම්

---------------------

(අ) ප්‍රධාන ලේජරයට අනුව ගිණුම් 3 ක ශේෂ එකතුව රු.401,737 ක් වූ අතර අවසාන ගිණුම් වලට අනුව එම එකතුව රු.47,647,583 ක් විය.

(ආ) කාර්ය මණ්ඩලය

---------------------

කාර්ය මණ්ඩල ණය ලේඛණයේ දැක්වුණු ගිණුම් ශේෂ 4 කට අදාල එකතුව වූ රු.314,375ක මුදල අවසාන ගිණුම් වලට ඇතුලත් කර නොතිබුණි.

1.3.3 අනුකූල නොවීම්

-------------------

පහත සඳහන් නීති,රීති,රෙගුලාසි සහ කළමනාකාරිත්ව තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදි නිරික්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| 1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන රීති) | | |
| පරිච්ඡේදය - V<br>වගන්තිය - 158(1) | - | සමාලෝචිත වර්ෂය අවසානයේ රු.798,670 ක් වූ හිඟ තක්සේරු බදු නොගෙවූ පුද්ගලයින්ට එරෙහිව සභාපති විසින් වරෙන්තු නිකුත් කර නොතිබුණි. |
| පරිච්ඡේදය - V<br>වගන්තිය - 140 | - | බේරුම් නොකළ රු.3,785,005 ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් සභාපති විසින් කටයුතු කර නොතිබුණි. |
| 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත | | |
| වගන්තිය 132(J) | - | වර්ෂයක් තුල දරනු ලබන විනෝද කටයුතු සඳහා වියදම් රු.1,000 නොඉක්ම විය යුතු අතර එම සීමාව ඉක්මවන වියදම් සඳහා පූර්ව අනුමැතිය අවශ්‍ය වේ. එනමුත් රු.30,515 ක් වූ විනෝද කටයුතු සහ ත්‍යාග ප්‍රදාන සඳහා මිලදී ගත් ත්‍යාග වෙනුවෙන් වූ වියදම් සඳහා පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි
ජනරජයේ මුදල් රෙගුලාසි
---------------------------------

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 571 | - | 1991-2010 කාල පරිච්ඡේදයට අදාල රු.2,885,751 ක් වු කල් ඉකුත් තැන්පතු පිළිබඳව රෙගුලාසිය ප්‍රකාරව කටයුතු නොකර මිශ්‍ර තැන්පතු ගිණුමේ රඳවා තිබුණි. |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක12/2000(iv) | - | චක්‍රලේඛය අනුව ප්‍රායෝගික පුහුණුව ලබන පුහුණුවන්නන්ට දිනකට රු.500 බැගින් දීමනා ගෙවිය යුතු වුවත් කාර්මික විද්‍යාලීය පුහුණුවන්නන්ට දිනකට රු.300 බැගින් ගෙවීම් කර තිබු බැවින් 2013 මැයි-ජුනි කාල පරිච්ඡේදය තුල රු.39,900 ක් අඩුවෙන් ගෙවා තිබුණි. |

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැති කම
---------------------------------------------

විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරිම
-----------------------------------------------------

විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා රු.42,630,490 ක් වටිනා ගණුදෙනු විගණනයේදි සන්නිරික්ෂණය කළ නොහැකි විය.

2. මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය
-------------------------------------

2.1 මුල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශ වලට අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වු ආදායම රු.88,098 ක් වු අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වු ආදායම රු.873,359 ක් විය.

2.2 මුල්‍ය පාලනය
------------------

අයවැය විධිමත්ව පිළියෙල නොකර තිබු නිසා අයවැයගත ආදායම සහ තත්‍ය ආදායම අතර රු.11,158,955 ක වෙනසක් ද අයවැයගත වියදම සහ තත්‍ය වියදම අතර රු.3,598,470 ක වෙනසක් ද විගණනයේදි නිරික්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය
-----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම
---------------------------------------------------------------------

සභාපති විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තත්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ශේෂය |
|---|---|---|---|
| ----------------- | ----------------- | -------- | --------------------- |
| | රු.000 | රු.000 | රු.000 |
| (i)වරිපනම් හා බදු | 57 | 119 | 799 |
| (ii)බදුකුලී | 3,429 | 4,318 | 270 |
| (iii)බලපත්‍ර ගාස්තු | 4,773 | 3,231 | - |
| (iv)වෙනත් ආදායම් | 27,925 | 39,675 | 58,327 |

2.3.2 උසාවි දඩ මුදල්

-----------------

(i.) ඉකුත් වර්ෂය සඳහා පේදුරුතුඩුව මහේස්ත්‍රාත් උසාවියෙන් ලැබිය යුතු උසාවි දඩ මුදල වූ රු.4,230,933 ක් ආදායම් හා ලැබිය යුතු මුදල් වශයෙන් මූල්‍ය ප්‍රකාශ වල ඇතුලත් කර තිබුණි. එනමුත් එම මුදල් ලබා ගැනිම සඳහා කටයුතු කර නොතිබුණි.

(ii.) පේදුරුතුඩුව මහේස්ත්‍රාත් උසාවියෙන් ලැබිය යුතු උසාවි දඩ මුදල් සඳහා රු.2,795,200 ක් සඳහා වූ ලැයිස්තුවක් ලබා ගෙන තිබුණි. එනමුත් අදාල මුදල මෙම වාර්තාවේ දින දක්වාම ලබාගෙන නොතිබුණි.

2.3.3 හිඟ ආදායම්

----------------

වරිපනම්, බදු සහ බදු කුලී වශයෙන් සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂය සඳහා ලැබිය යුතු මුදල රු.1,069,166 ක් විය. මෙම මුදල් අයකර ගැනිම සඳහා ඵලදායි ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව දිගින් දිගට හිඟ ආදායම් වශයෙන් දක්වා තිබුණි.

2.4 වාර්ෂික භාණ්ඩ සමික්ෂණය

------------------------------------

(i.) 2012 වර්ෂය සඳහා වූ සමික්ෂණ මණ්ඩල වාර්තාවට අනුව අයිතම 17 ක ඌනතා නිරික්ෂණය විය.

(ii.) සමික්ෂණ මණ්ඩල වාර්තාවට අනුව අයිතම 4 ක් යාපනය සංවර්ධන මන්ඩලයට භාර දි තිබුණි. එනමුත් ඒ බැව් තහවුරු කිරිම සඳහා ලියවිලි හෝ ලිපි කිසිවක් ගොනුවේ නොතිබුණි.

2.5 වත්කම් කළමනාකරණය

--------------------------

2.5.1 වාහන උපයෝජනය

-----------------------

(i.) වසර ගණනාවක් තිස්සේ හානියට පත් වාහන පහක් සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

(ii.) වාහන තුනක සැතපුම් මාපක ක්‍රියා විරහිතව පැවති බැවින් කිලෝ මීටරයකට පරිභෝජිත ඉන්ධන ප්‍රමාණය ගණනය කළ නොහැකි විය.

(iii.) උතුරු පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 2 වැනි පරිච්ඡේදයේ 69 සහ 69(1) වගන්තියට අනුකූලව අංක WALG 8974 දරන පික්අප් රථයට සිදු වූ හානිය පිළිබඳව විගණකාධිපතිට දන්වා නොතිබුණි.

2.6 කොන්ත්‍රාත් පරිපාලනය
--------------------------------

2.6.1 අනුමැතියකින් තොරව සිදුකළ ප්‍රධාන වැඩ
---------------------------------------------------

සභාව විසින් තම අයවැය මගින් අනුමැතිය නොලබා, සමාලෝචිත වර්ෂය තුලදී රු.1,113,045 ක් වූ ප්‍රාග්ධන වැඩ සිදුකර තිබු බැව් නිරික්ෂණය විය.

2.6.2 ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති
--------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය මගින් අනුමත කළ රු.මිලියන 16.4 ක් වූ ප්‍රාග්ධන ව්‍යාපෘති 09 ක් ක්‍රියාත්මක නොකිරිම නිසා ජනතාවට ලැබිය යුතු ප්‍රතිලාභ අහිමි වි තිබුණි.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-----------------------------------

පළාත් පාලන කොමසාරිස් විසින් 2008-2010 වර්ෂ තුලදී ප්‍රජා මධ්‍යස්ථාන වලට වෙන්කර දී තිබුණු රු.336,000 ක මුදලක් මධ්‍යස්ථාන වලට ප්‍රධානය නොකර මිශ්‍ර තැන්පතු වල රඳවාගෙන තිබුණි.

3. පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

(අ) ආදායම් එකතු කිරිම
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) වාහන උපයෝජනය
(ඈ) අයවැය
(ඉ) මිශ්‍ර තැන්පතු
(ඊ) කාර්ය මණ්ඩල ණය ලේඛණය සැසඳීම